ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND
*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor* : Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



## පුද්ගලික සටහනක් තබමි!

අකමැත්තෙන් වුවද මෙසේ කරන්නට සිතුනේ මීට සුදුසු වෙන කාලයක් නැති නිසාය. මෙය පුද්ගලික සටහනක් වුවත් කියවන ඔබ වෙහෙස කරවන්නක් නොවෙනු ඇතැයි සිතමි.

මා එක්සත් රාජධානියට පැමිණ ගිය සතියට වසර 30 ක් සම්පූර්ණ විය. මේ වසර 30 තුළ මගේ ජීවිතයේද ශ්‍රීලංකාවේ ද සමස්ථ ලෝකයේ ද බොහෝ වැදගත් නොවැදගත් දේ සිදුවුණු බව සැබෑවකි. එසේ කීවද මා පිළිබඳව වැදගත් නොවූ කිසිවක් වීයයි මට සිතාගත නොහැකිය. වසර 30 ක් ඉක්ම ගිය ද මේ කාල පරිච්ඡේදය තුළ සිදුවූ සියල්ල ඊයේ පෙරේදා සිදුවූවාක් මෙන් මට සිතෙන් පහසුවෙන් අල්ලා ගත හැකිය. යළි යළිත් ලිහා බැලිය හැකිය.

මෙය ලියන මොහොතේ එළියේ ඉතා දැඩි හිම පතනයක් සිදුවන බව මට වැසූ කවුළු වීදුරුවෙන් පෙනේ. එකෙණෙහිම මගේ සිත දුව යන්නේ 1979 ජනවාරි අන්තිම දා මා ලන්ඩනයට මුලින්ම පැමිණුණ දා අත්විඳි සීත ලයි. මා ලන්ඩනයට කැඳවූ මගේ අනුග්‍රාහිකාව අද අප අතර නැති ලංකා මල්ලිකා රත්නායක මහත්මිය මට මේ මොහොතේ සිහිපත් වෙයි. ඇය මා සඳහා වූල් මෆ්ලරයක් හා වූල් ඇඟ-වැස්මක් ද රැගෙන හීත්රෝ පැමිණ සිටියාය. එදා ප්‍රථම වරට පාර දෙපස සුදෝ සුදු හිම කඳු දුටු මට සිතේ ඇති වූ චමත්කාරය හා විෂ්මය ද මතක්වෙයි. එහෙත් අද හිම වැටීම එතරම් වැදගත් දෙයක් වශයෙන් නොසිතෙන තරමට එය අපට හුරු පුරුදු වී ඇත.

මා එන කාලයේ ලන්ඩනයේ අද තරම් සෙනගක් නොවූ බව මට හොඳින් මතකය. අද ඇඟේ නොහැපී පාරේ යන්නනට බැරි තරම්ය. අදට වඩා එදා නිස්කලංකව අවට සිරි නරඹන පහසුව වීය. බස් රථවල හා උමං දුම්රියේ මේසා තදබදයක් ද එදා තිබුණේ නැත.

එදා තරුණයෙකු ලෙස ලන්ඩනයට ආ මම අද මැදිවයසේ පසුවෙමි. මා මෙහිදී දැන හඳුනාගත් දහසකුත් එකක් සහෘදයෝද එසේ වෙති. සමහරෙකු අප අතහැර නොඑන්නටම ගොසිනි. එදා හඳුනාගත් යහලුවෝ ගණනාවක් අද ද මගේ සමීප මිතුරෝ වෙති.

මෙම වසර 30 තුළ එංගලන්තයට සාපේ-ක්ෂව බලතහොත් අප මව්බිම ශ්‍රීලංකාවේ ඇති වෙනස අති විශාලය. එය ශ්‍රීලංකාවේ වෙසෙන අයට නොතේරේ. එය දැනෙන්නේ ලංකාවෙන් බැහැරව සිට ආපසු ගිය දිනකය. ඒ වෙනස් කම් දෙස බලා තැවෙන්නටද සංතෝෂ වෙන්න ටද සිදුවන නමුත් මා සියල්ල දෙස බලන්නේ ඒ මැදින් මතුවන උපේක්ෂාවෙනි.

තිස් වසරක දේ මෙවැනි තීරුවක ලියා දැක්විය හැකි නොවේ. විශාල පොතක් ලිවිය යුතුය. ඒසඳහා මෙය ප්‍රවේශයක් කරගන්නෙමි. මම විවිධ රටවල සැරිසරා ඇත්තෙමි. මේ මහා බ්‍රිතාන්‍යයේ සෑම අස්සක් මුල්ලක් නෑර ඇවිද ඇත්තෙමි. මගේ දැනුම දියුණු කරගත්තෙමි. අසීමිතව ආදරය ලබා ඇතිතෙමි. ගුණවාදීව බොහෝ දකින්නෙමි. නිසැකවම කිවයුතු දෙයක් නම් මට පසුතැවෙන්නට දෙයක් නැති බව ය. එසේම මේ ගතවූ තිස්වසර පුරා මා උපන් දේශය කෙරෙහි ඇති ඇල්ම මගේ සිතින් කිසි විටකවත් යාන්තමින් හෝ ගිලිහුණේ නැත.



# වහින්නට හැකි නම් ගිගුම් දී වියලි ගම් බිම් වලට ඉහළින්

**රුහුණු සරසවියේ පාලි හා බෞද්ධ අධ්‍යන අංශයේ ප්‍රධානි**
***පූජ්‍ය ආචායඊ විලේගොඩ අරියදේව හිමි විසිනි***

ජවන ගීත ප්‍රසංගයේ විශාරද නන්දා මාලිනී ගයන ඒ ගීතය මහාචායඊ සුනිල් ආරියරත්නයන්ගේ රචනාවකි. මේ ගීතය ඇසෙද්දී මට සිහිවන්නේ අනුන්ගේ ලේ මස් සූරාගෙන තම ආත්මාර්ථය සලසා ගැන්මට පුරුදුවන ලෝකයකි. එහෙත් ඒ මිනිසුන් අතරින්ම තම ඇස්, හිස්, මස්, ලේ පුදා පරාර්ථය සලසමින් බුදුබවට පෙරුම්පුරන බෝසත්වරුන් සිටින බව ද මට සිහිපත්වේ.

මහායාන බුදු දහමේ ඉගැන්වෙන පරිදි බුදුබව පතනා බෝධිසත්වයන්ගේ චිත්ත ස්වභාවය **බෝධි චිත්තය** නමින් හැඳින් වේ. සා පිපාසයෙන් පෙලෙන කෙනෙකුට මම ආහාරයක් වෙම්වා! රෝගයෙන් පෙලෙන කෙනෙකුට මා බෙහෙතක් වෙම්වා! නිදිබර වූ කෙනෙකුට මා සහනයක් වෙම්වා! යනුවෙන් සිතන, අනුන්ගේ යහපත පිණිස කැපවූ අයට අපි බෝසතුන් යයි කියමු.

එවන් මිනිස්සු සුළු පිරිසක් හෝ අප අතර සිටිති. බොහෝ දෙනා ආත්මාර්ථ කාමීව සිටිද්දී අතලොස්සක් වූ පරාර්ථ කාමීන් කීපදෙනා නිසා මේ සමාජය ලස්සන වන බව අවම වශයෙන් අප තේරුම්ගැනීම වැදගත් වේ. මිනිසත්කම තවම අප සමාජය තුළ තිබෙන බව පෙනෙන්නේ ඒ අතලොස්සක් බෝසත් ගුණ ඇති මිනිසුන් නිසා ය.

සමාජයක් විවිධ රුචි අරුචිකම් වලින් ද නානාවිධ බුද්ධි මට්ටමින් ද, අනේකවිධ ආකල්පයන්ගෙන් ද, නානා ගති ලක්ෂණ වලින් ද සමන්විත විචිත්‍ර දෙයකි. අද මා ගෙනහැර දක්වන්නේ අංගුත්තර නිකායේ ප්‍රථම වළාහක සූත්‍රය මගින් පෙන්වා දෙන පුද්ගලයන් හතර දෙනෙකු පිළිබඳවයි.

## අංගුත්තර නිකායේ ප්‍රථම වළාහක සූත්‍රය

අහස දෙස නෙත සිත යොමා බැලුව හොත් ඔබට පෙනේවි අහස ඒකාකාරී නොවන බව. හැම විටම අහස වෙනස් වෙයි. එහි වළාකුළු එකම ආකාරයටම නොපවතී. සමහර දවසක වළාකුළු වේගයෙන් ගසාගෙන යයි. තවත් දවසක ඒවා හෙමින් හෙමින් ඇදී යයි. ඇතැම් දවසක වැපිරීමට සූදානම් කරන උදැල් ලෙන් කෙටූ කුඹුරක් මෙන් මුළු අහසම පුංචි වළා කැබලිවලින් පිරී පවතී. ඒ අතර කිසියම් දිනයක මුළු පරිසරයම අඳුරු කරමින් මුළු අහසම වසාගෙන වළාකුළක් පවතී. තවත් දවසක විදුලි කොටමින් ගොරවමින් තිබෙන වැහි වළාකුළු ද දැකගත් හැකි ය. ඇතැම් වළාකුළු කිසිදු ගෙරවීමක් විදුලි කෙටීමක් නොමැතිව අනෝරා මහ වැසි වස්සවයි. තවත් දවසක අකුණු පහරින්ද පිරීගිය වළාකුළු වලින් මහා වැහි වසී.

මේ අහසේ වළාකුළු ස්වභාවයෙන් යුතු මිනිසුන් අප සමාජයේ සිටින බව බුදුරජාණන් වහන්සේ එම වළාහක සූත්‍රයෙන් පැහැදිලි කරති. එහි දැක්වෙන්නේ වළාකුළු සතර වර්ගයක් ද ඒ හා සමාන මිනිසුන් සතර වර්ගයක් ද අප සමාජයේ සිටින බවයි.

1. නේව ගජ්ජිතා නොවස්සිතා (ගෙරවිලි නැති වැසි නැති වළාකුළු)
2. ගජ්ජිතා නොවස්සිතා (ගොරවන එහෙත් නොවසින වළාකුළු)
3. වස්සිතා නොගජ්ජිතා (ගෙරවීමක් නැති වහින වළාකුළු)
4. ගජ්ජිතාව වස්සිතාව (ගෙරවීමත් වැස්සත් දෙකම ඇති වළාකුළු)

මෙම වළාකුළු වර්ග සතර මෙන් සතරාකාර මිනිසුන් අප සමාජයේ සිටින බව බුදුහාමුදුරුවෝ පෙන්වා දෙති. ඔව්හු ගිහියන් අතරද පැවිද්දන් අතර ද වෙති.

අනුන්ගේ යහපතට කිසි ම දෙයක් ක්‍රියාවෙන් හෝ වචනයෙන්වත් නොදක්-වන අය පළමුවන වළාකුළු වර්ගය හෙවත් ගෙරවීමක් නැති වැස්සක් නැති වළාකුළු වර්ගයටට අයත්ය. ඔවුන් ඉතා ආත්මාර්ථකාමීය. එබඳු වළාකුළකින් වන්නේ පරිසරය අඳුරුවන එක පමණි.

දෙවැනි වළාකුළ ගොරවනවා පමණකි, වැහි බිඳක්වත් හෙලන්නේ නැත. එම ගනයට අයත් අය කතා කරනවා ගෝෂා නගනවා පමණක් මිස කිසිදු යහපත් කායඊයක් නොකරති. දෙවෙනි වළාකුළ පළමු වළාකුළට වඩා යම් වටිනාකමක් දරයි. එනම් නිශ්ශබ්දව නොසිට අඩුගණනේ සමාජ අසාධාරණකම් ගැනවත් කතාකිරීමයි.

තුන්වෙනි වළාකුළ විදුලි නොකොටයි, ගිගිරුම් නොදෙයි, එහෙත් ධාරාණීපාත වැසි වස්සයි. එය යහපත් වළාකුළකි. එබඳු මිනිස්සු නිහඬව සමාජ යහපත වෙනුවෙන් තමනට කළහැකි කායඊය නොපිරිහෙළා ඉටු කරති. අනුන් හඳන්නට යහපතට යොමු කරන්නට නොයති. එහෙත් නිවැරදිව තමන්ගේ විමුක්තිය පමණක් සඳහා ක්‍රියා කරති. ඒ ගනයේ අය මුලින් දැක්වූ දෙදෙනාට වඩා උසස් බව කිව හැකිය. එහෙත් ඔහු ශ්‍රේෂ්ඨ තත්වයට තැබිය නොහැකිය. කෙනෙකු ශ්‍රේෂ්ඨයෙකු වන්නේ තමන්ගේත් අනුන්ගේත් යහපත සලසන කෙනෙකු වූවොත් පමණි.

සතරවන වළාකුළ පරිපූර්ණ එකකි. සම්පූර්ණ වැස්සක් වන්නේ ගුගුරා අකුණු කොටා මුළු පොළවම නහවන වැස්සක් වූවොත් පමණි. අකුණු කෙටීමෙන් ඇතිවන විද්‍යුත් ක්‍රියාදාම යෙන් වායුගෝලයේ ඇති නයිට්‍රජන් වායුව අම්ලය බවට හැරී එය ගස්වැල් වලට උරාගන්නට සැලැස්වීමෙන් වෘක්ෂ ලතාවන්හි එලදාව වැඩී ඉන් සමස්ත පරිසරයම ශෝභා සම්පන්න වන්නේය.

එම වළාකුළට සමානවන පුද්ගලයා බුදුදහමේ හඳුන්වන්නේ පරමාදර්ශී තැනැත්තා ලෙසය. තමා ධර්මයෙහි හැසි-රෙමින්, නිවැරදිව ජීවත්වෙමින් ඒ ජීවන ක්‍රමයේ යහපත් ඵලවිපාක විඳිමින් අන් අයත් යහපතෙහි පිහිටුවීමට ඔහු වෙර දරයි. ඔවුන් වෙනුවෙන් ඔහු කැපවෙයි.

ඔබ අනුන්ට කරදරයක් නොවී ජීවත්වීම යහපත් ය. ඒ යහපත් ජීවිතය වඩාත් යහපත් එකක් වන්නේ ඔබ යහපත්ව වෙසෙමින් ඔබේ වචනය, සිතුවිල්ල හා ක්‍රියාව අනුන්ගේ යහපත සඳහාද යෙදවූවහොත් පමණි. ඔබ ඒ අනුව ක්‍රියා කරන විට ගුගුරා ඇද හැලෙන වැහි වළාවක් වීමට ඔබට හැකිවන්නේ ය.

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### හිතෝපදේශයෙන්

**කෘතශතමසත්සු නෂ්ටං - සුභාෂිතංච නෂ්ටමබුධෙශු**
**වචනශතම වචන කරේ - බුද්ධිශතම චේතනේ නෂ්ටම්**

***අර්ථය*** : **දුර්ජනයන් කෙරෙහි කරන ලද සිය ගණන් උපකාර නැසුණි. මෝඩයන් විෂයෙහි කියන ලද සිය ගණන් යහපත් උපදෙස් ද නැසුණි. වචන නොපිළිගන්නනු කෙරෙහි සිය ගණන් වචනද නැසුණි. චේතනා නැත්තන් කෙරෙහි සිය ගණන් බුද්ධියද නිෂ්පලය.**

කෙනෙකුට ජීවත්වීම සඳහා ලැබී ඇත්තේ සීමිත කාලයකි. ජීවිතයට සම්බන්ධ අහිතකර ගුණධර්ම බැහැර කිරීම හා හිතකර ගුණදහම් එක්කර ගැනීම එම කාලය තුළ සිදුවිය යුත්තකි. තමාගේ ජීවිතයෙන් එක් පුද්ගල යෙකුගේ හෝ ජීවිත සැනසිල්ලට යම් උපකාරයක් වේ නම් එය සමාජයට සිදුවන වැදගත් සේවාවකි. එවන් සේවාවන් හතරක් ගැන මෙම පද්‍යයෙන් විස්තර කොට ඇත. ඒවා නම් අනුන්ට උපකාර කිරීම, යහපත් උපදෙස් සැපයීම, යහපත් වචන හා බුද්ධිමය වශයෙන් යම් උපකාරයක් කිරීමයි.

සැනසිල්ල සදා දෙන අර්ථවත් ජීවිතයක් සකස්කර ගැනීමේ ක්‍රම නිවැරදිව වටහාගැනීම යනු බුද්ධිමත්බවයි. ජීවිතයක් තුළ පවතින අනර්ථකාරී ගුණධර්ම වලින් බේරී අර්ථවත් ජීවිතයක් ගතකිරීමේ ධර්මයන් ළඟාකර ගන්නේ නම් සැනසිල්ලේ ජීවත්වීමේ භාග්‍යය උදාකරගත හැකිය.

ඒ නිසා සැනසිලිදායක අයිතියක් අපේක්ෂා කරන්නා යහපත් ක්‍රියාමාර්ගයන්ට බැසගත යුතුය. එම මාර්ගය සාදාගැනීමට අවංකබව, නිහතමානීබව, සුවච කීකරුබව, මුදුබව වැනි ගුණාංග ජීවිතයට ළංකර ගත යුතුව ඇත. අවංකබව මිනිස්කම සුරකෙන උතුම් ගුණාංගයකි. එය රැකගත යුත්තේද මහත් පරිශ්‍රමයකිනි. වංකභාවය මිනිසුන් තුළ පවත්නා පොදු දුර්වලතාවකි. මේ නිසාම මිනිසුන් හඳුනා ගැනීම පහසු නොවන බව බුදුරජාණන් වහන්සේද දේශනා කොට ඇත. තිරිසනුන් ගේ ජීවිත ඉතා විවෘතබවත්, මිනිසුන් ගේ චරිත සැඟවුණු ඒවා බවත් එක්තරා ඇත්ගොව්වෙකු පැවසූ විට එය සැබෑවක් බව බුදුරජාණන් වහන්සේ වදාළහ.

විශේෂයෙන් ඉහතින් දක්වා ඇති පද්‍යයෙන් විස්තර කරන්නේ යමෙක් තම ජීවිතය අර්ථවත් කරගැනීම සඳහා දෙනු ලබන උදව් උපකාර සහ අවවාද අනුශාසනා ඉතා ගෞරවයෙන් වැළඳගෙන ඒවාට අනුකූලව කටයුතු කළ යුතු බවයි. නමුත් එසේ නොකරන්නෝද අප සමාජයේ ඇත. එබඳු හතරාකාර පුද්ගලයින් ගැන මෙහි සඳහන් කර තිබේ. එනම් දුදනන්, මෝඩයින්, කියන දේ නාහන්නන් සහ හිතා මතා කටයුතු නොකරන්නන් යන කොටස් හතරයි.

පළමුවෙන් සඳහන් කරන්නේ දුදනන් ගැනයි. දුදනන්ට එකක් දෙකක් නොව සිය වරක් උදව් උපකාර කළද ඔවුන් ඉන් නිසි ප්‍රයෝජන නොගන්නා බවයි. ඔවුන්ට කරන උපකාර ඵල රහිත වන බවයි. දෙවනුව සඳහන් කරන්නේ මෝඩයින්ගේ එක් ලක්ෂණයකි. එනම් ඔවුන්ට දෙනු ලබන යහපත් උපදේශයන්ද අර්ථ ශූන්‍ය වන බවයි. ඒ නිසා මෝඩයින්ට දෙන උපදෙස්ද ප්‍රවේශමෙන් දිය යුතුයි. හේතුව මෝඩකම නිසාම එම යහපත් උපදේශයන් වැරදි ලෙස පාවිච්චි කිරීමෙන් විනාශය පවා ළඟාකරගන්නා හෙයිනි. දෙවෙනි කරුණ මෙන්ම තෙවෙනි කාරණය වශයෙන් සඳහන්කරනු ලබන සත්පුරුෂයින්ගේ යහපත් වචනද ඒවා නොපිළිගන්නන් කෙරෙහි පිළිගැන්වීමෙන් වන්නේ ඒවා ඵල රහිත වන බවයි. අවසන් වශයෙන් දක්වන්නේ හිතාමතා කටයුතු කළ නොහැකි පුද්ගලයාගේ බුද්ධියෙන්ද කිසිදු වැඩක් නොවන බවයි. ඉන් ගම්‍යවන්නේ බුද්ධිමත්ව හිතාබලා යමක් කිරීමේ හැකියාව පුද්ගලයින් සතුව තිබිය යුතු බවයි.

එමනිසා සමාජයට කෙසේ වෙතත් තම තමන්ටවත් යහපතක් සලසා නොගන්නා සමාජයට එතරම් වටින්නේ නැත. සමාජයට අවශ්‍යකරන්නේ කළ උපකාර මතකයේ තබාගෙන, ඉන් තමන්ටත් අනුන්ටත් අර්ථවත් දෙයක් කරන, සුදුසු පුද්ගලයන්ගෙන් උපදෙස් අවවාද අනුශාසනා ලබාගෙන, හිතාමතා බුද්ධිමත්ව කටයුතු කරන අයයි.



♦ ***පූජ්‍ය විල්ඹය***
***විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Colombo Office**
Visa Refusals
Property Purchase in Sri Lanka

**Hegoda & Hegoda**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**